සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- **දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක 01 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01 සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යයාගේ සිට හයවැනි ස්ථානයේ වූ කක්ෂයේ ගමන් කරන ග්‍රහලෝකය .......................................................... වේ. (සෙනසුරු / බ්‍රහස්පති / යුරේනස්)

02 සූර්යයාගේ හා චන්ද්‍රයාගේ ඒකාබද්ධ ගුරුත්වාකර්ෂණය නිසා සිදුවන .............................. සාගර ජල මට්ටම ඉහළ නැගීමෙන් සිදුවේ. (බාදිය / උදම් / වඩදිය)

03 සෑම ස්ථානයකටම එකම වේලාවක මධ්‍යාහ්නය පැමිණෙන නිසා .................................... රේඛා මධ්‍යාහ්න රේඛා ලෙස හඳුන්වයි. (අක්ෂාංශ / කක්ෂගත / දේශාංශ)

04 චන්ද්‍රයාගේ භ්‍රමණ සහ පරිභ්‍රමණ කාලය දින 27 පැය 07 විනාඩි ................................................ ලෙස සමාන නිසා සෑමවිටම සඳේ එකම පැත්තක් පෘථිවිය දෙසට හැරී පවතී. (55 / 65 / 45)

05 දේශාංශ 15$^{o}$ ක් භ්‍රමණයවීමට ගතවන කාලය ..................................... නිසා දේශාංශවල පිහිටි රටවල වේලාවේ වෙනස්කම් ඇතිවේ. (විනාඩි 1 / විනාඩි 4 / පැය 1)

- අංක 06 10 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 ජුනි 21 කර්කටක නිවර්තනයට හිරු මුදුන්වීම නිසා දක්ෂිණාර්ධගෝලයට ශීත ඍතුව උදාවේ. (    )

07 සූර්ය පාරජම්බුල කිරණවලින් පෘථිවිය ආරක්ෂා කරන්නේ අපරිවර්තී ගෝලය මගිනි. (    )

08 ලොරෙන්සියානු සානුව ආසියා මහාද්වීපයේ පිහිටා තිබේ. (    )

09 දකුණු ආසියානු රටවල් අතුරින් ඉන්දියාව හැරුණුවිට දෙවනුව විශාල රට පාකිස්ථානය වේ. (    )

10 දකුණු ආසියාතික රටවල පවතින උෂ්ණත්වය හින්දු කුෂ් ඇතුළු නැමිකඳු මණ්ඩලය නිසා සමනය වී ඇත. (    )

- අංක 11 15 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.

11 ඉන්දියාවේ අඩුම උෂ්ණත්වය ලැබෙන්නේ ............................................. සිට පෙබරවාරි දක්වා මාසවලය.

12 දකුණු ආසියාතික රටවලින් වනාන්තර බහුලම රට ......................................................... වේ.

13 නේපාලය, භූතානය වැනි රටවල ......................................... ජන වර්ගයට අයිති ජනතාව ජීවත් වේ.

14 පාකිස්ථානය හා ............................................... යන රටවල උර්දු භාෂාව කථාකරන ජනතාව දක්නට ඇත.

15 ශ්‍රී ලංකාවේ වැදි ජනයා මෙන්ම පාකිස්ථානයේ ........................................ ජනයා ආදිවාසීන් වේ.

● අංක 16 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

16 දකුණු ආසියානු රටවල පවතින ව්‍යාපාරික කෘෂිකර්මයට අඩංගු වන බෝග වර්ග පමණක් සහිත පිළිතුර තෝරන්න.

(1) තේ, තිරිඟු, පලතුරු, උක් (2) මිලට්, රබර්, හණ, තේ

(3) කපු, හණ, උක්, පොල් (4) උක්, වී, ධාන්‍ය, මිලට්

17 පහත දැක්වෙන රටවලින් ධීවර කර්මාන්තය සඳහා වැඩි වැදගත්කමක් හිමිවන රට කුමක් ද?

(1) භූතානය (2) ඉන්දියාව (3) නේපාලය (4) මාලදිවයින

18 ඉන්දියාවේ බලශක්තිය සම්බන්ධව නඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) රටේ නිපදවන මුළු බලශක්ති ප්‍රමාණයෙන් වැඩි කොටසක් ග්‍රාමීය ජනතාව භාවිතා කරයි.

(2) ආහාර පිසීම හා ආලෝකය ලබාගැනීමට වැඩිදෙනෙකු ජීව වායු ඒකක භාවිතා කරයි.

(3) සුළු පරිමාණයේ කර්මාන්තවලට යොදාගන්නා ජල විදුලිබල ශක්තිය අධිකය.

(4) බලශක්තිය සඳහා විද්‍යුත් මාධ්‍ය ඒකක භාවිතය අධිකය

19 යපස් නිෂ්පාදනය නිසා ඉන්දියාවට ඇතිවී තිබෙන විශේෂ වාසිය මින් කුමක් ද?

(1) කර්මාන්ත අඩපණවීම. (2) රැකියා හිඟවීම.

(3) යටිතල පහසුකම් වර්ධනය වීම. (4) කෘෂිකාර්මික බිම් වැඩිවීම.

20 ග්‍රාමීය කර්මාන්ත බහුලව වර්ධනය වී තිබෙන පාකිස්ථානයේ ප්‍රදේශයක් වන්නේ මින් කුමක් ද?

(1) සින්ධ් හා කරච්චි (2) ඔරිස්සා හා මධ්‍ය ප්‍රදේශ


(3) ගෝව හා මයිසූර් (4) බෙංගාලය හා බිහාරය

(2 x 20 = 40)

## II කොටස

● **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 භූ ලක්ෂණ සිතියම් ආශ්‍රිතව ඔබ ඉගෙනගත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A B C

(1) 1 : 50000 සිතියම්වල භෞතික ලක්ෂණ දෙකක් ඉහත A, B රූප සටහන්වල දැක්වේ. ඒවා නම් කරන්න. (ල. 02)

(2) ඉහත C රූප සටහනෙහි නිම්නය හා නෙරුව පවතින රේඛා දෙක වෙන වෙනම දක්වන්න. (ල. 02)


(3) 1 : 50000 සිතියම්වල සමෝච්ච රේඛා ළඟින් පිහිටන බෑවුම කුමන නමකින් හඳුන්වනු ලැබේද? (ල. 02)

(4) රතු වර්ණයෙන් දැක්වෙන පහත සඳහන් පරිපාලන මායිම් නම් කරන්න.

1. + − − + − − + − − 2. — ••• — ••• — ••• — (ල. 02)

(5) 1 : 50000 සිතියම්වල දැක්වෙන මෙම ලක්ෂණය පවතින්නේ පහත සඳහන් කවර ස්ථානයකදැයි තෝරන්න. (ල. 02)


(ගංගාවක මැද / කන්දක මුදුන / වෙරළ අසල)




(6) භූ ලක්ෂණ සිතියම්වල භාවිතා කරන සංස්කෘතික ලක්ෂණ 3 ක් නම් කරන්න. (ල. 03)

(7) භූ ලක්ෂණ සිතියමක් මගින් අපට ලැබෙන වාසි 3 ක් සඳහන් කරන්න. (ල. 03)

02 දක්වා ඇති දකුණු ආසියානු කලාපයේ භූ දර්ශන සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(1) A ප්‍රදේශයේ පිහිටි සානුව දක්වන්න.

C ප්‍රදේශයේ පිහිටි සානුව නම් කරන්න.

(2) B හා J වලින් දැක්වෙන කඳුවැටි නම් කරන්න.

(3) D හා F වලින් දැක්වෙන ගංගා නම් කරන්න.

(4) E වලින් දැක්වෙන ලෝකයේ විශාලම ඩෙල්ටාව පිහිටි රට හා K වලින් දැක්වෙන රට දක්වන්න.

(5) G වලින් දැක්වෙන මුහුදු ප්‍රදේශය හා H වලින් දැක්වෙන තුඩුව නම් කරන්න.

(6) I වලින් දැක්වෙන කාන්තාරය නම් කරන්න. (ල. 11)

03 (1) රටක සංවර්ධනය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 02)

(2) පහත සඳහන් අංග වලින් රටක මානව සංවර්ධනයේ ගුණාත්මක දෑ මැනීමට යොදාගතහැකි දෑ වෙන්කර දක්වන්න.

(සාක්ෂරතාවය / ඒක පුද්ගල ආදායම / කාර්මික දියුණුව / ළදරු මරණ අනුපාතය / මාතෘ මරණ අනුපාතය / ප්‍රවාහනය / උපතේදී අපේක්ෂිත ආයුකාලය) (ල. 04)

(3) රටක උසස් සාක්ෂරතා මට්ටමක් පවතින විට දැකිය හැකි ලක්ෂණ 5 ක් ලියන්න. (ල. 05)

04 (1) දකුණු ආසියාතික රටවල පවතින කර්මාන්ත වර්ග ඇසුරින් මෙම වගුව සම්පූර්ණ කරන්න. (ල. 05)

| ප්‍රදේශය / රට | කර්මාන්තය |
|---|---|
| හණ කර්මාන්තය | 1. .................................................. |
| 2. .................................................. | මාලදිවයින |
| යපස් කර්මාන්තය | 3. .................................................. |
| 4. .................................................. | පකිස්ථානය |
| තේ කර්මාන්තය | 5. .................................................. |

(2) රටක ග්‍රාමීය කර්මාන්ත මගින් ග්‍රාමීය ජන ජීවිතය කෙරෙහි ඇතිකරන යහපත් බලපෑම් 3 ක් සඳහන් කරන්න. (ල. 03)

(3) යපස් කර්මාන්තය ව්‍යාප්ත වී ඇති රටවල එම කර්මාන්තය දියුණුවීම කෙරෙහි බලපා ඇති කරුණු 3 ක් දක්වන්න. (ල. 03)

05 (1) පෘථිවි භ්‍රමණය යනු කුමක් ද? (ල. 03)

(2) පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන බලපෑම් 2 ක් ලියන්න. (ල. 02)

(3) ග්‍රිනිච් වේලාව දහවල් 12.00 නම් පහත සඳහන් දේශාංශවල වේලාව හා දේශාංශවල අගය ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න. (ල. 06)

| දේශාංශය | වේලාව |
|---|---|
| නැගෙනහිර දේශාංශ 30º | ........................................ |
| ........................................ | පෙ.ව. 2.00 |
| බටහිර දේශාංශ 60º | ........................................ |
| ........................................ | ප.ව. 3.00 |

06 (1) පහත දැක්වෙන්නේ දකුණු ආසියානු රටවල වාසය කරන ජන කොටස් කීපයකි. එම A, B, C, D, E, F ජන කොටස් නම් කරන්න. (ල. 06)




(2) ශ්‍රී ලංකාව හැර සික් ආගම, ජෛන ආගම, ඉස්ලාම් ආගම අදහන දකුණු ආසියාතික රටවල් එක බැගින් නම් කරන්න. (ල. 03)

(3) දිවෙහි හා උර්දු භාෂා කථා කරන ජන වර්ග දකුණු ආසියා රටවලින් දක්වන්න. (ල. 02)